02

# පෙබරවාරියේ හා ඔක්තෝබර් මාසවලදී කම්කරු පන්තියේ සහ ගොවි ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වය

රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් අතර පලල්ව පැතිර තිබුනා වූ ද ඉමැනිසිපේෂන් ඔෆ් ලේබර් ගෲප් (කම්කරු විමුක්ති කණ්ඩායම) සංවිධානය තුළින් අරඹි, මෙන්ශේවික්වරුන් තුළින් ඉතාම පරිපූර්ණ ප්‍රකාශන අත්කරගන්තා වූ ද මාක්ස්වාදයේ පොතේගුරුවාදී විකෘත රූපයට ඔක්තෝබර් විප්ලවයේ ගමන් මග සහ ප්‍රතිඵලය නිර්දය පහරක් එල්ල කලේය. මෙම ව්‍යාජ මාක්ස්වාදයේ සාරය සමන්විත වූයේ, කාර්මික වශයෙන් වඩා සංවර්ධිත වූ රට කරන්නේ අඩුවෙන් සංවර්ධිත වූ රටට හුදෙක් එම රටෙහි අනාගත ප්‍රතිරූපය පෙන්නුම් කිරීමය යන මාක්ස්ගේ සාධකාපේක්ෂි සීමාසහිත සංකල්පය (මාක්ස්ගේම වචනවලින් කියතොත්) නිරපේක්ෂ ඉතිහාසෝත්තර නියාමයක් බවට විකෘති කිරීමෙනි. ඉක්බිති එම විකෘතිය මත කම්කරු පන්ති පක්ෂයේ උපායන් පදනම් කිරීමට ප්‍රයත්න දැරීමෙනි. වඩා සංවර්ධිත රටවල් 'පූර්වාදර්ශයක්' ලබා දෙන තෙක් රුසියානු කම්කරු පන්තිය විසින් බලය අල්ලා ගැනීම සඳහා කෙරෙන අරගලය ගැන සිතීම පවා මෙම ප්‍රවිෂ්ටය විසින් ස්වාභාවිකව ම බැහැර කරන ලදි. සෑම පසුගාමී රටක් ම තමන්ගේ ම අනාගතයේ සමහර ලක්ෂණ දියුණු රටවල්වල ඉතිහාසය තුළින් දක ගනිතියි යන්න ඇත්ත වශයෙන් ම අවිවාදිත ය. එහෙත් සමස්ත වර්ධනය ම පුනර්කරනය කිරීම පිළිබඳව කතාව සාවද්‍යය. මෙයට ප්‍රතිකූලව ධනේෂ්වර ආර්ථිකය වැඩි වැඩියෙන් ලෝක ව්‍යාප්ත ස්වභාවයක් අත්කර ගනිත් ම පසුගාමී රටවලට සිය පසුගාමීත්වයේ අංග ධනේශ්වර සංවර්ධනයේ නවතම අංග සමග අවශ්‍යයෙන් ම ඒකාබද්ධ කිරීමට සිදු වන හෙයින් එම පසුගාමී රටවල සංවර්ධනය වඩ වඩාත් සිත් කා වදින ලෙස අභූතපූර්ව ස්වාභාවයක් අත්කර ගනී. ජර්මනියේ ගොවිජන යුද්ධය යන කෘතියේ ප්‍රස්තාවනාවේ එංගලස් මෙසේ ලිවීය. "සෑම තැනක දී ම එක විට හෝ වර්ධනයේ එක ම මට්ටමේ දී එළඹීම අනිවාර්යයෙන් ම අවශ්‍ය නැති කිසි යම් අවධියක දී තමන් ඉක්මවා තමන්ගේ කම්කරු පන්ති සගයා වර්ධනය වී ඇති සැටි සිතට ගන්නට ධනේශ්වරය පටන් ගනී. " අනෙකුත් සියලු ම රටවල ධනපති පන්තීන්ට පොරොතුව හා පරිපූර්නව, මෙම නිරීක්ෂණය කරා එළඹීමට ඓතිහාසික සංවර්ධනයේ ගමන් මග විසින් රුසියානු ධනේශ්වරයට බල කරන ලදි. ලෙනින් 1905 ට ද පොරතුව, " කම්කරු පන්තියේ සහ ගොවි ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වය" යන සූත්‍රය ඉදිරිපත් කිරීම මගින් රුසියානු විප්ලවයේ ස්වවිශේෂ ස්වභාවයට ප්‍රකාශනයක් අත්කර දුනි. එහි අනාගත වර්ධනය පෙන්නුම් කල පරිදි මෙම සූත්‍රයට අර්ථයක් අත්කර ගත හැකි වූයේ ගොවි ජනයාගේ සහාය ලත් කම්කරු පන්තියේ සමාජවාදී ආඥාදායකත්වය කරා වූ අවධියක් ලෙස පමණකි. ලෙනින් සිය සූත්‍රය ඉදිරිපත් කලේ මුල සිට අගටම විප්ලවකාරී වූ ද ගතික වූ ද පරිපූර්නව හා අශමනියව මෙන්ශේවික් රටාවට ප්‍රතිවිරුද්ධව පිහිටියා වූ ද ආකාරයකිනි. මෙන්ශේවික් රටාවට අනුව රුසියාවට උරුම වූයේ ධනේෂ්වර පන්තිය බලයට පත් කර සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් විපක්ෂයේ පිහිට වූ දියුණු ධනපති රටවල ඉතිහාසය පුනර්කරනය කිරීම පමනි. කෙසේ වෙතත් අපේ පක්ෂයේ සමහර කණ්ඩායම් අවධාරණය කලේ ලෙනින්ගේ සූත්‍රයේ කම්කරු පන්තියේ හා ගොවිජනතාවගේ ආඥාදායකත්වය නොව, එම සූත්‍රයේ

සමාජවාදී ස්වභාවයට ප්‍රතිවිරුද්ධව ප්‍රජාතන්ත්‍රවාදී ස්වභාවයයි. යලිත් මෙමගින් උකහා ගත හැකි එකම නිගමනය නම් පසුගාමී රටක් වූ රුසියාව තුළ සංකල්පනය කළ හැකි එක ම දෙය ප්‍රජාතන්ත්‍ර විප්ලවය බවයි. සමාජවාදී විප්ලවය ඇරඹෙනු ඇත්තේ බටහිරය, අපට සමාජවාදයේ මාවතට පිවිසිය හැක්කේ එංගලන්තය, ප්‍රන්සය සහ ජර්මනිය පසුපස්සේ ම පමනි. එහෙත් ප්‍රශ්නය මේ අන්දමින් සූත්‍රගත කිරීම අනිවාර්‍යයෙන්ම මෙන්ශේවික්වාදය කරා පල්ලම් බැසීමකි. විප්ලවය පිළිබඳ කර්තව්‍යයන් පූර්ව-ඥානනය සඳහා නොව තීරණාත්මක ක්‍රියාව සඳහා අප ඉදිරියේ තබනු ලැබූ 1917 දී මෙය මුලුමනින් ම එලිදරව් විය.

විප්ලවය සැබැවින් ම සිදුවන තතු තුළ, ප්‍රජාතන්ත්‍රයට සහයෝගය දීමේ අස්ථානය එහි තර්කානුකූල නිගමනය කරා එනම්, 'තත්වය මුහුකුරා නැති' නිසා සමාජවාදයට විරුද්ධ වීම කරා තල්ලු කරනු ලැබූ කල් හි දේශපාලනයේ දී එහි අර්ථය වූයේ කම්කරු පන්තියක ආස්ථානයක සිට සුලු ධනේෂ්වර ආස්ථානයකට මාරු වීම ය.

පෙබරවාරි විප්ලවය, තනිකර සලකා බැලුව හොත් ධනේෂ්වර විප්ලවයක් විය. නමුත් ධනේෂ්වර විප්ලවයක් ලෙස එය එළඹුනේ කල් පමාව ය. කිසියම් ම ස්ථාවරත්වයකින් තොරව ය. ද්වන්ධ බලය තුළ වහාම ප්‍රකාශනයක් අත්කර ගත් පරස්පර විරෝධයන් විසින් දෙකට ඉරා දමනු ලැබූ පෙබරවාරි විප්ලවය එක්කෝ කලින් ම කම්කරු පන්තික විප්ලවයේ පූර්ව ගායනය බවට පත්විය යුතුව තිබුනි. ඇත්තට ම සිදු වූයේ මෙයයි. නැත හොත් කිසි යම් වර්ගයක ධනේෂ්වර බහ්වාධිකාරයක් යටතේ අර්ධ-විජිත තත්ත්වයකට රුසියාව ඇද වැටිය යුතුව තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස පෙබරවාරි විප්ලවයෙන් පසු සමය සලකා බැලිය හැකි වූයේ දෘෂ්ටි කෝණ දෙකකින් පමනි. එක්කෝ 'ප්‍රජාතන්ත්‍ර' විප්ලවය තහවුරු කොට වර්ධනය කොට, මුදුන්පත් කිරීමේ කාල පරිච්ඡේදයක් ලෙසය. නැතහොත් කම්කරු පන්තික විප්ලවයට සූදානම් වීමේ කාල පරිච්ඡේදයක් ලෙසය. ප්‍රථම දෘෂ්ටි කෝනය දරන ලද්දේ මෙන්ශේවික්වරුන් හා සමාජ විප්ලවාදීන් විසින් පමණක් නොවේ. අපගේම පක්ෂය මුදුනේ සිටි අයගෙන් සමහරුද එසේ කළහ. එහෙත් එක් වෙනසක් ඇතිවය. එනම් දෙවනු කී කොටස ප්‍රජාතන්ත්‍ර විප්ලවය හැකිතාක් දුරට වමට තල්ලු කිරීමට ඇත්ත වශයෙන්ම මාන බැලීමය. එහෙත් යොදාගත් විධික්‍රම එකක් ම විය. එනම් පාලක ධනේශ්වරය මත 'පීඩනය යෙදීම' යි. මෙම 'පීඩනය' ධනේශ්වර ප්‍රජාතන්ත්‍ර පාලනයේ රාමුව යටතේ ම රැඳීමට ගනන් බලන ලද පීඩනයකි. මෙම පිළිවෙත පවත්වා ගෙන යනු ලැබී නම් විප්ලවයේ වර්ධනය අපගේ පක්ෂයේ හිසට උඩින් ගොස්, අවසානයේ දී කම්කරු ගොවි ජනතාවගේ සන්නද්ධ නැගිටීම පක්ෂ නායකත්වයෙන් තොරව සිදුවනු ඇත. වෙනත් වචන වලින් කිවහොත් ජූලි දිනවල සිද්ධි සද්දන්ත පරිමාවකින් යලි සිදු වන්ට තිබුනි. එසේ වී නම් මේ වතාවේ දී එය සිදු වනු ඇත්තේ සිද්ධියක් ලෙස නොව ව්‍යසවනයක් ලෙසය.

එබඳු මහා ව්‍යසනයක ක්ෂනික ප්‍රතිඵලය වීමට තිබුනේ අපේ පක්ෂය ශාරීරිකව වැනසී යාම බව පරිපූර්නව සුපැහැදිලි ය. මෙය අපගේ මතභේද කොතරම් ගැඹුරුද යන්න පිළිබඳ මිනුම්දන්ඩක් සපයයි.

විප්ලවයේ ප්‍රථම කාල පරිච්ඡේදයේ දී මෙන්ශේවික්වාදීන් සහ සමාජ විප්ලවවාදීන්ගේ බලපෑම, සත්තකින්ම, අහම්බයක් වූයේ නැත. එය පිළිබිඹු කලේ ජනගහනය තුළ සුලු ධනේශ්වර ජනකාය ප්‍රධාන වශයෙන් ම ගොවි ජනතාව බහුල බවයි. විප්ලවයේ ම නොමේරූ බවයි. නායකත්වය නැතිනම් අඩු ගනනේ නායකත්වයේ ඡායාවක් සුළු ධනේශ්වර විප්ලවවාදීන් අත තැබුනේ හරියට ම මෙන්න මේ යුද්ධයේ අතිශයින් ම සුවිශේෂ තත්ත්වයන් මැද පැන නැංගා වූ නොමේරූ බව විසිනි. ඉන් පහත සඳහන් විපාකය අත් විය. ඔවුහු ධනේෂ්වරයට බලය දරා සිටීමට ඇති ඓතිහාසික අයිතිය ආරක්ෂා කලහ. එහෙත් රුසියානු විප්ලවය 1917 පෙබරවාරි සිට ඔක්තෝබරය දක්වා ගත් මග හැර වෙනත් මගක් ගැනීමට ඉඩ තිබුනේ නතැයි මින් කිසි සේත් ම නො කියැවේ. ඉහත සඳහන් ගමන් මග පන්තීන් අතර සබඳතා මගින් පමණක් නොව යුද්ධය විසින් නිර්මානය කරනු ලැබූ තාවකාලික තත්වයන් මගින් නිර්නය කෙරුනි. යුද්ධය නිසා ගොවි ජනතාව, දස ලක්ෂ කීප ගනනක් වූ හමුදාවක් තුළ සංවිධිතව අවිදරන තත්ත්වයක් උද්ගත විය. කම්කරු පන්තිය තමන්ගේ ම ධජය යටතේ සංවිධානයව ගම්බද ජනතාවගේ නායකත්වය සියතට ගැනීමට පෙර සුලු ධනේශ්වර විප්ලව වාදියෝ යුද්ධයට එරෙහිව කැරලි ගසමින් සිටි ගොවින්ගෙන් සමන්විත හමුදාව තුළ ස්වාභාවික ආධාරකයක් සොයා ගත්හ. කුමක් වුවත් සියල්ල සෘජුව රැඳී පවත්නා වූ මෙම දසලක්ෂ සංඛ්‍යාත හමුදාවේ යෝධ බර තුළින් ගැම්මක් ගත් සුලු ධනේශ්වර විප්ලවවාදියෝ කම්කරුවන් මතට පීඩනය යොදමින්, මුල් කාල පරිච්ඡේදයේ දී කම්කරුවන් තමන් පිටුපසින් ඇද ගෙන ගියහ. පන්ති පදනම වෙනස් නොවීම විප්ලවය වෙනත් මාවතක් ගැනීමට ඉඩ තිබුනු බව හොඳාන්ම පැහැදිලි වන්නේ යුද්ධයට ක්ෂණිකවම පොරොතු ව එළඹුනු සිද්ධීන්ගෙනි. 1914 ජූලියේ දී පෙට්‍රොග්‍රෑඩ් නගරය විප්ලවවාදී වැඩ වර්ජනයන්ගෙන් සලිත විය. විවෘත වීදි සටන් දක්වා වැඩ දික් ගැසී තිබුණි. එම ව්‍යාපාරයේ පරම නායකත්වය තිබුණේ අපේ පක්ෂයේ රහසිගත සංවිධානය ද නීත්‍යානුකූල පුවත්පත් ද අතය. දියකරහැරීම්වාදයට ද පොදුවේ සුලු ධනේශ්වර පක්ෂවලට ද එරෙහිව සෘජු අරගලයක දී බොල්ශේවික්වාදය තම බලපෑම වර්ධනය කර ගිනිමින් සිටියේය. ව්‍යාපාරයේ වැඩි දුර වර්ධනයෙන් අන් සියල්ලටමත් වඩා බොල්ශේවික් පක්ෂයේ වර්ධනයක් අර්ථවත් විය හැකිව තිබුනි. 1914 දී කම්කරු නියෝජිතයන්ගේ සොවියට් සභා වර්ධනයන් සෝවියට් සභාවල මට්ටම කරා ලගා වී තිබුනේ නම් ආරම්භයේ සිටම බොල්ශේවික් සෝවියට් සභා බවට පත් වීමට හොඳටම ඉඩ තිබුණි. ගම්වල පිඹිදීම බොල්ශේවිකයන් විසින් මෙහෙයවනු ලබන නාගරික සෝවියට සභාවල සෘජු හෝ වක්‍ර නායකත්වය යටතේ ඉදිරියට යා හැකිව තිබුණි. මෙයින් අවශ්‍යයෙන්ම අදහස් වන්නේ සමාජ විප්ලවවාදීන් ගම්වලින් කෙලින් ම අතුරුදහන් වීම නොවේ. නැත. හොඳටම ඉඩ තිබුනේ ගොවි විප්ලවයේ ප්‍රථම අවධිය නාරෝද්නිකයන්ගේ ධජය යටතේ සිදුවීමයි. නමුත් අප විසින් කලින් ලුහුඬින් සටහන් කරන ලද සිද්ධීන්ගේ වර්දනය ද සමග නාගරික බොල්ශේවික් සෝවියට් සභා සමග සන්ධානයක් ඇති කර ගැනීමේ බලාපොරොත්තුවෙන් නාරෝද්නිකයන්ට ම තමන්ගේ වාමාංශය ඉදිරියට දැමීමට සිදුවනු ඇත. සත්තකින්ම එබඳු තත්ත්වයක දී වුවත් සන්නද්ධ නැගිටීමේ ක්ෂනික ප්‍රතිඵලය ප්‍රථමයෙන් ම රඳා පවතිනු ඇත්තේ ගොවි ජනයා සමඟ බැඳී පැවති හමුදාවේ මනෝගතිය හා හැසිරීම උඩය. යුද්ධයේ පිපිරීම වර්ධනයන්ගේ දම්වැලේ දූවැන්ත හා අලුත් පිරිද්දීමක් ඇති නොකළේ නම් 1914-

1915 ව්‍යාපාරය ජයග්‍රහනය කරයි ද නැත් ද යන ප්‍රශ්නය දූන් සලකා බැලීම කිසි සේත් ම කළ නොහැකි වනවා පමනක් නොව අනවශ්‍ය වැඩි වැඩක් ද වෙයි. කෙසේ වෙතත් ජයග්‍රාහී විප්ලවය 1914 ජූලි සිද්ධීන් සමග ඇරඹුනු මාවත දිගේ දිග හැරුනේ නම්, සාර්වාදී රාජාණ්ඩුව පෙරලා දීමීම, විප්ලවකාරී කම්කරුවන්ගේ සෝවියට් සභා බලය ක්ෂනිකව සියතට ගෙන, වාම නරෝද්නිකයන්ගේ මාර්ගයෙන් එම සෝවියට් සභාවල කක්ෂය තුළට (ආරම්භයේ පටන් ම) ගොවි ජනතාව ඇද ගැනීමට තුඩු දෙනු ඇත.

යුද්ධය දිග හැරෙමින් පැවති විප්ලවවාදී ව්‍යාපාරයට බාධා කලේ ය. යුද්ධය පළමුවෙන් එසේ බාධා කළ නමුත් පසුව දැවැන්ත ලෙස විප්ලවවාදී ව්‍යාපාරය වේගවත් කළේය. යුද්ධය දසලක්ෂ සංඛ්‍යාත හමුදාව මගින් සුළු ධනේශ්වර පක්ෂවලට සාමාජික වශයෙන් ද සංවිධානාත්මක වශයෙන් ද පරම විශේෂ පදනමක් නිර්මානය කර දුනි. ගොවි ජනතාව සංඛ්‍යාවෙන් මහත් වුව ද ඔවුන් තුළට විප්ලවවාදී අධ්‍යාසයක් කා වැදී ඇති විට දී පවා ඔවුන් සංවිධානාත්මක පදනමක් මත තහවුරු කිරීම දුෂ්කර වන්නේ ය. යන්න තුළ ගොවි ජනතාවගේ ස්වවිශේෂ ස්වභාවය නිශ්චිතව සමන්විතව ඇත. හමුදාව නම් වූ 'රෙඩි මේඩ්' සංවිධානයේ උරමතට නැග ගත් සුලු ධනේශ්වර පක්ෂ, කම්කරු පන්ති ග්‍රාන්ත කොට, දේශාරක්ෂකවාදයෙන් ව්‍යාකූල කර දූමී ය. නව තත්වයන් තුළ බොල්ශේවික් පක්ෂය දේශාරක්ෂකවාදී පෙරමුනේ වාමාංශය බවට පරිවර්තනය කිරීමේ අර්ථය ගත්තා වූ "කම්කරු පන්තියේ සහ ගොවි ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වය" නම් පැරනි සටන් පාඨයට එරෙහිව ලෙනින් මේ තරම් ම දරුනු ලෙස එක් වර ම ඉදිරියට ආවේ මේ නිසාය. ඔහුට ප්‍රධාන කර්තව්‍යය වූයේ කම්කරු පන්තියේ පෙරටු බලඇනිය දේශාරක්ෂකවාදයේ වගුරෙන් එළිමහනට මෙහෙයවීම ය. ගම්බද වැඩ කරන ජනතාවට සංකේන්ද්‍රනය වී ගත හැකි පක්ෂයක් ලෙස කම්කරු පන්තියට මීලග අවධියේ දී පෙරට ඒ ගත හැකි වනු ඇත්තේ මෙම කොන්දේසි උඩම පමණකි. එහෙත් එය එසේ නම් ප්‍රජාතන්ත්‍ර විප්ලවය කෙරෙහි නැතහොත් ඊටත් වඩා කම්කරු පන්තියේ හා ගොවි ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වය කෙරෙහි අපගේ ආකල්පය කුමක් විය යුතුද? නව සහ ජීවමාන යථාර්ථයේ ස්වවිශේෂතා හදාරනවා වෙනුවට කටපාඩමින් උගත් සූත්‍ර නිරර්ථව පුනරුච්චාරනය කරමින්, අපේ පක්ෂයේ ඉතිහාසයේ දී එක් වරකට වඩා කනගාටුදායක ක්‍රියා කලාපයක් ඉටු කලේ ය යි ලෙනින් සඳහන් කල 'පැරනි බොල්ශේවිකයන්' බන්ධනය කිරීමේදී ඔහු නිර්දය විය. "අප පාද තැබිය යුත්තේ පැරනි සූත්‍ර අනුකූලව නොව, නව යථාර්ථය අනුවය" ලෙනින් මෙසේ විචාලේ ය. "ධනේෂශ්වර ප්‍රජාතන්ත්‍ර විප්ලවය සම්පූර්ණ වී නැත" යි යන කමනෙව් සහෝදරයාගේ පැරනි බොල්ශේවික් සූත්‍රයේ යථාර්ථයක් පැවතීද?" "නැත" යි ඔහු පිළිතුරු දුනි. "එබන්දක් ඇත්තේ නැත. එය මිය ගොසිනි. එය යලි පන ගැන්වීමට දරන සියලු ම ප්‍රයත්න නිරර්ථ වනු ඇත." (එකතු කෘති, 14 වන වෙලුම, 28, 33 පිටු)

පෙබරවාරි විප්ලවයේ මුල් කාල පරිච්ඡේදයේ දී කම්කරු, ගොවි හා සොල්දාදු නියෝජිතයන්ගේ සෝවියට් සභා යම් ප්‍රමාණයකට, කම්කරු පන්තියේ සහ ගොවි ජනතාවගේ විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වය ගැබ්කර ගත් බව ලෙනින් ඉඳහිට සඳහන් කළ බව ඇත්ත ය. මෙම සෝවියට් සභා

පොදුවේ බලය අන්තර්ගත කර ගත් තාක් දුරට මෙය සත්‍ය විය. එහෙත් ලෙනින් යලි යලිත් පැහැදිලි කලාක් මෙන් පෙබරවාරි කාල පරිච්ඡේදයේ සෝවියට් සභාවල ගැබ්ව පැවතියේ අඩු බලයක් පමනි. ඒවා ධනේෂ්වර පන්තියේ බලය මත අර්ධ විපාර්ශ්වීය 'පීඩනයක්' යොදමින් එම බලයට ආධාර කලහ. කම්කරුවන්ගේ ගොවියන්ගේ සහ සොල්දාදුවන්ගේ ප්‍රජාතන්ත්‍ර සභාගයේ රාමුව ඉක්මවීමට ඒවාට ඉඩ නුදුන්නේ හරියට ම මෙම අතරමැදි ආස්ථානය මයි. මෙම සභාගය සිය පාලන ආකෘතිය තුළින්, ආඥාදායකත්වය දෙසට නැමී තිබුනේ එය පරිපාලිත ආණ්ඩු සබඳතාවන් වෙනුවට සන්නද්ධ බලය සහ ඍජු විප්ලවවාදී අධීක්ෂණය මත රඳුනුතාක් දුරට ය. කෙසේ වෙතත් එය සැබෑ ආඥාදායකත්වයක මිම්මට වඩා බෙහෙවින් අඩුය. සම්මුතිවාදී සොවියට් සභාවල අස්ථාවරත්වය නිශ්චිතව ම රැඳී පැවැත්තේ මෙම කම්කරුවන්ගේ, ගොවියන්ගේ හා සොල්දාදුවන්ගේ අජ-බල හවුලේ ප්‍රජාතන්ත්‍ර නිර්ව්‍යුහතාව තුලය. සෝවියට් සභා එක්කෝ සැබෑ බලය සියතට ගත යුතුව තිබුනි. නැත හොත් නැත්තට ම නැති විය යුතුව තිබුනි. එහෙත් ඒවාට බලය ගත හැකිව තිබුනේ විවිධ පක්ෂයන් විසින් නියෝජනය කෙරුනු කම්කරුවන්ගේ හා ගොවියන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී සභාගයක් ලෙස නොවේ. තනි පක්ෂයක් විසින් මෙහෙයවනු ලබන්නා වූ ද ගොවි ජනයාගේ අර්ධකම්කරු කොටස් වලින් පටන් ගෙන ගොවි ජනතාව තමන් පසුපසට ඇදගන්නා වූ ද කම්කරු පන්ති ආඥාදායකත්වය ලෙස පමණි. වෙනත් වචනවලින් කිවහොත් කම්කරුවන්ගේ හා ගොවියන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානයක් හැඩ ගැසිය හැකිව තිබුනේ සැබෑ බලය අත් කර ගැනීමට අසමත් වූ නොමේරූ බල ආකෘතියක් හැටියට ම පමනි. එයට හැඩ ගැසිය යුතුව තිබුණේ ප්‍රවනතාවක් හැටියට මිස සංයුක්ත හැටියට නොවේ. බලය අල්ලා ගැනීම දෙසට වූ ඕනෑම ගමනක් අනිවාර්යයෙන් ම ප්‍රජාතන්ත්‍ර නිබන්ධන පුපුරා හැරිය යුතුව තිබුනි. ගොවියන්ගේ බහුතරයට කම්කරුවන් අනුගමනය කිරීමේ අවශ්‍යතාව මුන ගැස්විය යුතුව තිබුනි. පන්ති ආඥාදායකත්වයක් ගොඩ නැගීමට කම්කරු පන්තියට අවස්ථාව සලසා එමගින් සමාජ සම්බන්ධතා නිර්දයව සහ සමූලව රැඩිකල් ප්‍රජාතන්ත්‍රකරණයකට ලක් කිරීමත් සමග කම්කරු රාජ්‍යය, ධනේෂ්වර දේපොල අයිතීන්ගේ ක්ෂේත්‍රය තුලට තනිකර සමාජවාදී කඩා වැදීමක් කිරීම න්‍යාය පත්‍රයට ඇතුලත් කල යුතුව තිබුනි. මෙම තත්ත්වය තුළ ප්‍රජාතන්ත්‍ර ආඥාදායකත්වයේ සූත්‍රයට එල්බ ගත් කවුරුන් වුව ද, එමගින්, බලය හැරපියා විප්ලවය ආවෘත අන්තරයකට ඇද දමනු ඇත.

සියල්ල සංකේන්ද්‍රනය වූ මූළික විවාදිත ප්‍රශ්නය වූයේ මෙයයි. අප බලය අල්ලා ගැනීමට සටන් කල යුතු ද නැත්ද? අප බලය බාර ගන්නවාද? නැත්ද? එවකට අප මුහුණ දී සිටින්නේ හුදෙක් තත්කාලීන මතභේදයකට නොව අතිශය බරපතල ප්‍රතිපත්තික අර්ථ භාරයක් උඩ භේද වූ ප්‍රවනතාවන් දෙකකටය. යන්නට මෙය ම සැහෙන සාක්ෂියකි. ප්‍රථම හා මූළික ප්‍රවනතාව කම්කරු පන්තික වූ අතර ලෝක විප්ලවයේ මාවතකට ගමන් කලේය. අනෙක 'ප්‍රජාතන්ත්‍රවාදී' එනම් සුලු ධනේෂ්වර වූ අතර අවසාන විග්‍රහයේ දී කම්කරු පන්තික පිලිවෙත ප්‍රතිසංස්කරණ සන්තතියක් තුළ ධනේෂ්වර සමාජයේ අවශ්‍යතාවන්ට යටත් කලේය. මේ ප්‍රවනතා දෙක 1917 වර්ෂය පුරා පැන නැගී සෑම වැදගත් ප්‍රශ්නයක් උඩු ම හතුරු සට්ටනයට එළඹුනි. මේ වර්ගයේ නොවැලැක්විය හැකි ලෙස ම ක්‍රියාවේ දී ඉස්මතු කොට එළිදරව් කරනු ලබන්නේ විප්ලවවාදී යුගයේ දීමය. එනම්, පක්ෂයේ රාශිභූත ප්‍රාග්ධනය ඍජුව

සංසරනයට දමන යුගයක ය. මෙය ප්‍රවනතා දෙක අඩු හෝ වැඩි ප්‍රමාණයකට, අඩු හෝ වැඩි විශෝධනයකින් යුතුව සෑම රටක ම විප්ලවකාරී කාල පරිච්ඡේදයේදී එක් වරකට වඩා ප්‍රකාශයට පත් වනු ඇත. බෝල්ශෙවික්වාදය යනුවෙන් මෙහි දී අවධාරනය කරන්නේ එහි සාරභූත අංශයයි. අප වටහා ගන්නේ කම්කරු පන්තියේ පෙරටු අවි බල ඇනියට අවි ඇතිව බලය අල්ලා ගැනීමට හැකි කරන්නා වූ පුහුණුවක් පන්නර ගැන්වීමක් හා සංවිධානයක් ලබා දීම නම්, අනෙක් අතට සමාජ ප්‍රජාතන්ත්‍රය යනුවෙන් අප අදහස් කරන්නේ ධනේෂ්වර සමාජයේ රාමුව තුළ ප්‍රතිසංස්කරනවාදී විපක්ෂ ධනේෂ්වර සමාජයේ රාමුව තුළ ප්‍රතිසංස්කරනවාදී විපක්ෂ ක්‍රියාකාරීත්වය පිලිගැනීම සහ ධනේශ්වර රාජ්‍යයේ අනුල්ලංඝනීය භාවය කා වැද්දීමට ජනතාව සැබැවින්ම පුහුණු කිරීම නම් එවිට සත්තකින් ම පරම වශයෙන් ම පහත සඳහන් දෙය පැහිදිලි වෙයි. ඉතිහාසයේ කෝව තුළින් පූර්න ලෙස වාත්තු වී පැන නොනගින කොමියුනිස්ට් පක්ෂය තුළ පවා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවනතා හා බොල්ශ්වික්වාදය අතර අරගලය අතිශයින් ම පැහැදිලි, විවෘත හා වෙස් නොවැසූ ස්වසෘපයෙන් එලියට එන්නේ බලය පිළිබඳ ප්‍රශ්නය මුහුනට මුහුනලා ඉස්මතු වන ආසන්න විප්ලවවාදී කාල පරිච්ඡේදය තුළ දී ය.

* * *

බලය අල්ලා ගැනීමේ ගැටලුව පක්ෂය ඉදිරියේ තබන ලද්දේ අප්‍රේල් 4 දාට පසුවය. එනම් ලෙනින් පෙට්‍රොග්‍රෑඩ් නගරයට පැමිණීමෙන් පසුව ය. එහෙත් එම මොහොතට පසුවද, පක්ෂයේ දේශපාලන පිළිවෙත ගත්තේ නැත. 1917 අප්‍රේල් සම්මේලනයේ දී ගත් තීන්දු නොතකා විප්ලවවාදී ගමන් මග කෙරේ විරුද්ධතාවය විටෙක සැඟවී, විටෙක විවෘතව සූදානමේ සම්පූර්ණ කාල පරිච්ඡේදය පුරා ව්‍යාප්තව පැවතුනි.

පෙබරවාරි මාසයේ පටන් ඔක්තෝබර් විප්ලවය තහවුරු කර ගැනීම දක්වා සමයේ මතභේදයන්ගේ දිශාව හැදෑරීම අතිවිශේෂ න්‍යායික වැදගත්කමක් පමණක් නොව, අතිමහත් ප්‍රායෝගික වැදසගත්කමක් ද දරයි. 1903 දෙවන පක්ෂ සම්මේලනයේ මතභේද අපේක්ෂි යයි, එනම්, පෙර ඇඟවුමක් ය යි යයි 1910 දී ලෙනින් ප්‍රකාශ කළේය. මෙම මතභේදයන් ඒවායේ උල්පතේ සිට, එනම් 1903 පටන් කරන හැදෑරීමක් තුළ සොයා ගැනීම ඉතා වැදගත්ය. එහෙත් එබඳු අධ්‍යයනයක් අර්ථවත් වන්නේ එය එහි තර්කානුකූල නිගමනයට ගෙන ගියොත් පමණි. එය මෙම මතභේදයන් තීරණාත්මක පරීක්ෂණයට ලක් කෙරුනු කාල පරිච්ඡේදය, එනම් ඔක්තෝබර් කාල පරිච්ඡේදය, ඇතුලත් කර ගන්නේ නම් පමනි.

මෙම ප්‍රස්තාවනාවේ සීමාවන් තුල ඒ අරගලයේ සෑම අවධීන් පිළිබඳව ම පරිපූර්ණ අධ්‍යයනයක් කල නොහැකි ය. එහෙත් අපේ පක්ෂයේ වර්ධනයේ අතිශයින්ම වැදගත් සමය පිළිබඳව අපගේ ලිපාලේඛනවල පවත්නා ශෝචනීය හිඩැස අඩු ගනනේ ආංශිකව හෝ සපුරාලීම මඟ නොහැරිය හැකි ය යි අපි සිතමු.

දැනට ම ප්‍රකාශ කොට ඇති පරිදි නො එකඟතාවන් කේන්ද්‍රනය වූයේ බලය පිළිබඳ ප්‍රශ්නය වටාය. පොදුවේ ගත් කල විප්ලවවාදී පක්ෂයේ (එමෙන්ම අනෙකුත් පක්ෂවල ද) ස්වභාවය තීන්දු කෙරෙන්නේ මේ උරගල විසිනි.

මෙම කාල පරිච්ඡේදයේදී ඉස්මතු කොට විසඳූ පිළිබඳ ප්‍රශ්නයත් යුද්ධය පිළිබඳ ප්‍රශ්නයත් අතර ඉතා සමීප සම්බන්ධතාවක් ඇත. අපි ප්‍රධාන භූමි ලක්ෂණ ගනනට ගිනිමින් මෙම ප්‍රශ්නකාලනියමානුකූලව සැලකිල්ලට භාජනය කිරීමට යෝජනා කරමු: ඒ සාර්වාදය පෙරලා දැමීමෙන් පසු සහ ලෙනින්ගේ පැමිණීමට පොරතුව ප්‍රථම කාල පරිච්ඡේදයේ පක්ෂයේ ද පක්ෂ පතපොතෙහි ද ආස්ථානය ලෙනින්ගේ ප්‍රවාද වටා ගිය අරගලය; අප්‍රේල් සම්මේලනය; ජූලි දවස්වලින් පසු; කෝර්නිලොව් සමය; ප්‍රජාතන්ත්‍ර සම්මේලනය සහ පූර්ව පාර්ලිමේන්තුව; සන්නද්ධ නැගිටීමහ හා බලය අල්ලා ගැනීම (සැප්තැම්බර් සිට ඔක්තෝබර් දක්වා); සහ 'සමාජාත' සමාජවාදී ආණ්ඩුවක් පිළිබඳ ප්‍රශ්නය, යනාදි වශයෙනි.

මෙම මතභේද අධ්‍යයනය කිරීම, කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ අනෙකුත් පක්ෂවලට සැලකිය යුතු වැදගත්කමක් දරන නිගමනයන් කරා එළඹීමට අපව සමත් කරනු ඇතැයි අපි විශ්වාස කරමු.

පරිවර්තනය : විජේ ඩයස්
කම්කරු මාවත ප්‍රකාශන